# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.01.21 පැය 1050 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/ 107 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk


**<u>පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2025.01.20 වන දින පොලිස් විශේෂ කාර්‍ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාතර්‍ාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 122 | 190 | යකඩ බැරල් 01<br>ප්ලාස්ටික් බූලි 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා බුත්තල කඳවුර.**

2025.01.20 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැල්ලවාය පොලිස් වසමේ ඇතිලිවැව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලි ග්‍රෑම් 290 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැල්ලවාය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වූ ඇතිලිවැව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වැල්ලවාය පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 03. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුර.

2025.01.20 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මැදවච්චිය පොලිස් වසමේ වහමල්ගොල්ලෑව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මත්කරල් 30 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මැදවච්චිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු 27 ක් වූ අනුරාධපුරය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මැදවච්චිය පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**